## ආදායකයා විසින් තබා ගත යුතුය

### නම් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සහ රීති

I. නම් කරනු ලැබිය හැක්කේ කවුරුන්ද?

(අ) තම කලත්‍රයා සහ/හෝ දරුවන් (නීත්‍යානුකූලව දරුකමට හදා ගැනීමට ගනු ලැබූ දරුවන්ද ඇතුළුව) පමණක් නම් කිරීමට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයකු වන විවාහකයකුට හිමිකම ඇත්තේය.

(ආ) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ අන් සියලුම සාමාජිකයන්ට තම කැමැත්ත පරිදි කවරුවුවද තැනැත්තකු හෝ තැනැත්තන් නම් කිරීමට හිමිකම ඇත්තේය.

යම් තැනැත්තකු විසින් තම විවාහයට පෙර කරන ලද නම් කිරීමක් ඒ තැනැත්තාගේ විවාහය සිදුකළ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

II. (අ) සාමාජිකයකු මියගිය අවස්ථාවේදී වලංගු නම්කිරීමක් බලාත්මකව නොපැවතියේ නම් හෝ ඒ සාමාජිකයාගේ නාමිකයා හෝ නාමිකයන්ගෙන් කිසිවකු හෝ සියලුම නාමිකයන් හෝ මියගොස් ඇත්නම්, ඒ මියගිය සාමාජිකයාගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට ගෙවීම කළ යුතුය.

(ආ) සාමාජිකයාගේ ජීවිත කාලය තුළදී ඒ සාමාජිකයාගේ නාමිකයා හෝ නාමිකයන්ගෙන් එක්කෙනෙකු හෝ මියගියහොත් ඒ සාමාජිකයා විසින් කර තිබුණු නම් කිරීම සම්පූර්ණයෙන්ම අවලංගු වන්නේය. එවැනි අවස්ථාවකදී යථා පරිදි සම්පූර්ණ කරන ලද නම් කිරීමේ අලුත් ආකෘති පත්‍රයක් ඒ සාමාජිකයා විසින් ඉදිරිපත් කළ යුතුය.

III. තම නාමිකයා වශයෙන් බාලවයස්කාරයකු පත්කොට තිබියදී ඒ බාලවයස්කරු වයෝප්‍රාප්තත්වයට පත්වීමට පෙර ඒ සාමාජිකයා මියගිය අවස්ථාවකදී ඒ නාමිකයාට ලැබිය යුතු ප්‍රතිලාභ ඒ බාලවයස්කරුගේ නමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කිරීම හෝ ඒ සාමාජිකයාගේ බුදලය සම්බන්ධයෙන් බුදල් නඩුවක් තිබේ නම් ඒ බුදල් නඩුවේ බැරට තැන්පත් කිරීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නීති උපදෙස්වලට අනුකූලව වෙනත් ආකාරයකින් නිදහස් කිරීම හෝ කරනු ලැබිය යුතුය.

IV. (i) නම් කිරීමක් සාමාජිකයකු විසින් අත්සන් කරනු ලැබූ විට
(1) දෙපාර්තමේන්තු/ශාඛා ප්‍රධානියා විසින් ;
(2) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයකු විසින්
එකී අත්සනට සාක්ෂි දැරිය යුතුය.

(ii) යම් සාමාජිකයකුට අත්සන් කිරීමට නොහැකි අවස්ථාවකදී ඒ සාමාජිකයාගේ අත්සන වෙනුවට, සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරිපිටදී තමාගේ වම් මාපටඟිලි සලකුණ තැබිය යුතු අතර, එය එකී සාක්ෂිකරුවන් දෙදෙනා විසින් සහතික කළ යුතුය.

V. යම් සාමාජිකයකු විසින් නම් කිරීමක් කර තිබියදී මේ මාර්ගෝපදේශවලට අනුකූලව අලුත් නම්කිරීමක් ඒ සාමාජිකයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත භාරදෙනු ලැබූ විටක, ඒ සාමාජිකයා විසින් කලින් කර තිබුණු සියලුම නම් කිරීම් ඉන් අවලංගු වන බව සහ ප්‍රත්‍යාදිෂ්ට වන බව සලකනු ලැබේ.

VI. නම්කිරීමක් කරන සාමාජිකයකුගේ මරණයට පෙර ඒ සාමාජිකයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත තම නම්කිරීම භාරදී තිබුණහොත් මිස, ඒ සාමාජිකයාගේ කිසිදු නම්කිරීමක් වලංගු සහ බලසහිත නොවන්නේය.

VII. යම් නාමිතයකු නම්කිරීම කළ සාමාජිකයාගේ මරණය සිදුවූ විට මිස, නම්කිරීමක් ප්‍රකාර අරමුදලින් යම් ප්‍රතිලාභයක් ලබාගැනීමේ හිමිකම නාමිතයකුට නැත. ඒ සාමාජිකයා මියගිය විට, -

(අ) ඒ නම්කිරීම කර ඇත්තේ ඒ සාමාජිකයා මියයාමට පෙර නම් ; සහ
(ආ) ඒ සාමාජිකයා මියගිය අවස්ථාවේදී ඒ නම්කිරීම බලාත්මකව පැවතියේ නම් පමණක් ප්‍රතිලාභ ලබාගැනීමේ හිමිකම එවැනි නාමිතයකුට ඇත්තේය.

VIII. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා සෑහීමට පත්වන පරිදි තම අනන්‍යතාව ඔප්පු කරනු ලැබුවහොත් මිස, කිසිදු මුදලක් කිසිදු නාමිතයකුට නොගෙවනු ලැබේ.

ලේඛන අංක: පූර්ධි/පිරප්/8

**විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල**
**නම් කිරීම**

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි |
|---|
| ........................................ |
| ........................................ |
| ........................................ |
| ........................................ |

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

(1) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 93(2අ) වගන්තිය යටතේ නම් කිරීම

........................ ................................................................................ හි ..................................................................

(ආයතනයේ නම) (තනතුරු නාමය)

වශයෙන් සේවයේ නියුතු ..............................................................................................................

(ස්ථිර ලිපිනය)

පදිංචි ........ ....................................................................................................................................

(සම්පූර්ණ නම)

වන මම මෙහි පසුපිටේ නම් සඳහන් තැනැත්තා/තැනැත්තන් ..............................(සංඛ්‍යාව අකුරෙන් සඳහන් කරන්න)

දෙනා අංක ..............................................................................(විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජික අංකය)

දරන මගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ගිණුමෙන් මට ගෙවිය යුතු මුදල මාගේ මරණයෙන් පසු ලබාගැනීමට හිමිකම ඇති තැනැත්තා/තැනැත්තන් වශයෙන් මෙයින් මම නම් කරමි. මීට සාක්ෂි වශයෙන් 19...... ....................................

මස........... වන දින ........................................................................................................................ දී

(ආයතනයේ නම)

මා විසින් අත්සන් කරන ලදී. තවද නම් කිරීම් වලට අදාළ රීති සම්බන්ධයෙන් මීට අමුණා ඇති මාර්ගෝපදේශද මා විසින් කියවා තේරුම් ගන්නා ලදී.

........................................................................
සාමාජිකයාගේ අත්සන
(හෝ අත්සන් කිරීමට නොහැකි සාමාජිකයෙකු නම් ඒ සාමාජිකයාගේ වම් මාපටැඟිලි සලකුණ)

අප ඉදිරියේදී සහ එකිනෙකා ඉදිරියේදී අත්සන් කරන ලදී.

..................................................................................
1 වන සාක්ෂිකරුගේ අත්සන
දෙපාර්තමේන්තු/ශාඛා ප්‍රධානියා
(නිල මුද්‍රාව තැබිය යුතුය)

නම.........................................................................

ජාතික හැඳුනුම්පත් අංකය.................................

පදවිනාමය ........................................ ..........

..................................................................
2 වන සාක්ෂිකරුගේ අත්සන
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයෙක්

නම ..................................................................

ජාතික හැඳුනුම්පත් අංකය...............................

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජික අංකය ......................................

ආයතන ප්‍රධානියාගේ සහතිකය

| | | |
|---|---|---|
| (2) i. | ආයතනය | ........................................ |
| ii. | සම්පූර්ණ නම | ........................................ |
| iii. | අර්ථසාධක අරමුදල් අංකය | ........................................ |
| iv. | ජාතික හැඳුනුම්පත් අංකය | ........................................ |

........................................................................මයා/මහත්මිය/මෙනෙවිය මේ ආයතනයේ සේවා නියුක්තිකයකු බවත්, ඉහත දැක්වෙන නම් කිරීම/නම් කිරීම් එකී සේවා නියුක්තිකයා විසින් කරන ලද බවත්, 2 වන කොටුවේ දක්වා ඇති විස්තර සත්‍ය හා නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

| | |
|---|---|
| ........................................ | ........................................ |
| *ලේඛකාධිකාරී | ආයතන ප්‍රධානියා |
| දිනය: ........................ | දිනය: ........................ |
| නම: ........................................ | නම: ........................................ |
| පදවිනාමය: ........................................ | පදවිනාමය: ........................................ |

තිල මුද්‍රාව තැබිය යුතුය.

*ආයතන/අනුබද්ධ විශ්වවිද්‍යාල විද්‍යායතන සම්බන්ධයෙන් වන විට ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් හෝ සහකාර ලේකම්

........................................දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබුනේය.

........................................................

භාරගත් නිලධාරියාගේ අත්සන

නම්කරනු ලබන්නන්ගේ ලේඛනය

| | සම්පූර්ණ නම | තිබේ නම් ජාතික හැඳුනුම්පත් අංකය | වයස | ඥාති සම්බන්ධය | කොටස | ලිපිනය |
|---|---|---|---|---|---|---|
| (1) | .................................... | .................... | ...... | .................... | .......... | .................... |
| | .................................... | .................... | ...... | .................... | .......... | .................... |
| (2) | .................................... | .................... | ...... | .................... | .......... | .................... |
| | .................................... | .................... | ...... | .................... | .......... | .................... |
| (3) | .................................... | .................... | ...... | .................... | .......... | .................... |
| | .................................... | .................... | ...... | .................... | .......... | .................... |
| (4) | .................................... | .................... | ...... | .................... | .......... | .................... |
| | .................................... | .................... | ...... | .................... | .......... | .................... |
| (5) | .................................... | .................... | ...... | .................... | .......... | .................... |
| | .................................... | .................... | ...... | .................... | .......... | .................... |

..................................................

සාමාජිකයාගේ අත්සන
(හෝ සාමාජිකයාට අත්සන් කළ නොහැකි
නම් වම් මාපටඇඟිලි සලකුණ)

දිනය : ....................